## නිවිතිගල ප්‍රාදේශීය සභාව
## රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 24 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජූනි 17 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ඔක්තෝබර් 13 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය ව්‍යාචනය

-------------------

මෙම වාර්තාවේ 1.3.4 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

i. අයවැයගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා සන්සන්දන ප්‍රකාශය.
ii. මුදල් ප්‍රවාහ ප්‍රකාශය.
iii. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් ඇතුළත් සටහන්.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රාජ්‍ය බැංකුවක පවත්වා ගෙනයනු ලබන සභාවට අයත් ස්ථාවර තැන්පතුවකට අදාලව 2013 ඔක්තෝබර් 06 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා වූ රු. 12,708 ක පොළී මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ආදායම් හා වියදම් ගිණුම සහ සාරාංශ ආදායම් ලේඛණය (ප්‍රා.ස 19) අනුව අය ශීර්ෂ 02 කට අදාලව රු. 190,950 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2012 වර්ෂයේ ණයහිමියන් වෙනුවෙන් වූ රු. 84,513 ක අධි වෙන්කිරීම් සමුච්චිත අරමුදල මඟින් ගලපා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක මුද්දර ගාස්තු ණයගැති ශේෂය වූ රු. 5,991,844 ක් ඉක්මවා ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ලද මුද්දර ගාස්තු ලැබීම් රු. 2,120,191 ක් සඳහා මුද්දර ගාස්තු ගිණුම හර කර සමුච්චිත අරමුදලට බැර කර ජ'නල් සටහන් මඟින් ගැලපීම් කල යුතු වුවත්, එසේ කටයුතු නොකිරීමෙන් වර්ෂාවසානයේ ණයගැති ගිණුමේ ශේෂය එකී වටිනාකමින් අඩුවෙන් දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබූ අතර, සමුච්චිත අරමුදල් ගිණුමද එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමුච්චිත අරමුදලට ගැලපිය යුතුව තිබූ රු. 195,805 ක හිඟ වැටුප් ගෙවීම මන්ත්‍රී වැටුප් ප්‍රතිපූර්ණ ගිණුමට ගැලපීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එකී වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

සමාලෝචිත වර්ෂය අවසානයේ ගිණුම් විෂයයන් 27 කට අදාලව ලෙජර් ගිණුම් අනුව ශේෂයන්ගේ හා උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව අතර රු. 3,832,924 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, එම වෙනසට හේතු සොයා බලා ලෙජර් ගිණුම් වලට අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. 7,340,290 ක් වටිනාකමැති බාහිර වගකීම් 02 ක් සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි නොමැති වීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකිවුණි.

(ආ) රු. 796,541 ක් වටිනාකමැති මිලදී ගැනීම් වලට අදාල ගෙවීම් අවස්ථා 06 ක් සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) අවසන් මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට සභාව සතු ස්ථිර තැන්පත් ආයෝජන වටිනාකම රු. 1,776,111 ක් වුවද, තැන්පතු සහතික භෞතික පරීක්ෂාව අනුව එම අගය රු. 565,473 ක් වූ බැවින් ආයෝජන වටිනාකම රු. 1,210,638 ක් සඳහා වන තැන්පතු සහතික හෝ බැංකුව මඟින් සනාථ කිරීමේ සහතික ඉදිරිපත් නොවුණි.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| | ------------------------------------------- | ------------------- |
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ 2005 ජූනි 08 වන දිනැති අංක 396/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද රීති | යොමුගත රීතියට පටහැනිව එකතුව රු. 60,000 ක් වූ මුදලක් සභා රැස්වීම් සඳහා සහභාගී නොවූ සභිකයින් 08 දෙනෙක් සඳහා අවස්ථා 12 කදී සභික දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| (ආ) | <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u><br>මුදල් රෙගුලාසි අංක 396 (ඈ) ප්‍රකාරව | නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල එකතුව රු. 14,285 ක් වටිනාකමැති චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් අදාලරෙගුලාසිය ප්‍රකාරකටයුතුකරනොතිබුණි. |

1.3.6 බලය නොළත් ගනුදෙනු

----------------------------

අයවැයගත ප්‍රතිපාදන හෝ පරිපූරක සලසා ගැනීමකින් තොරව වැය විෂයයන් 16 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු. 2,142,623 ක වියදම් දරා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්ථන වියදම රු. 494,779 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 4,452,599 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

2012 වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 4,452,599 ක් වුවද, 2013 වර්ෂයේ මෙහෙයුම් ඌනතාවය රු. 494,779 ක් වූයෙන් වර්ෂය තුල මූල්‍ය ප්‍රතිඵලය සියයට 111 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ආදායම වැඩිවීමේ වේගයට වඩා වැඩි වේගයකින් වියදම් වැඩිවීමත්, කුළී ආදායම්, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් වල සිදුවී ඇති අඩුවීමත්ය.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 1,367 | 1,624 | 1,075 |
| බදු කුලී | 3,792 | 3,025 | 90 |
| බලපත්‍ර ගාස්තු | 672 | 181 | 435 |
| වෙනත් ආදායම් | 22,237 | 18,856 | 453 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

-------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා රැස්කල ආදායම සැසඳීමේදී කුළී ආදායමෙහි හා බලපත්‍ර ගාස්තු වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල ආදායමෙහි පිළිවෙලින් සියයට 22 හා සියයට 73 ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

2.3.3 <u>බදු</u>

i. නිවිතිගල පොළ ආශ්‍රිතව අළුතින් ආරම්භ කරන ලද එළු මස් හා කුකුල් මස් කඩය ටෙන්ඩර් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු. 48,000 ක මුදලකට බදු දී තිබූ අතර, ඒ සඳහා තක්සේරු වාර්තාවක් හෝ ලබා නොගෙන බදු වටිනාකම තීරණය කර තිබුණි. ඒ අනුව බදු මුදල තීරණය කල ආකාරය පිළිබඳව විගණනයට පැහැදිලි නොවුණි. එම බදු ගිවිසුම 2013 ජූලි 15 දින එනම් මාස 6 ½ ක කාලයක් ප්‍රමාද කර අත්සන් කර තිබූ අතර, බදුකරු විසින් ජනවාරි සිට ගිවිසුම් දිනය දක්වා අදාල බදු මුදල සහ ඇප තැන්පත්

මුදල් ගෙවා නොතිබුණි. බදුකරු විසින් කඩය බදු ගන්නා අවස්ථාවේදී එම කඩයට විදුලිය ලබා ගැනීම වෙනුවෙන් වැය කරන ලද රු. 30,625 ක් මාසික කුළිය වෙනුවෙන් හිලව් කිරීමට කටයුතු කරමින් තිබුණි.

ii. පොළ භූමියෙහි පිහිටි අංක 1 මාළු ලැල්ල මිල ඉදිරිපත් වූ දෙවෙනි ටෙන්ඩර්කරු වෙත ලබා දී තිබූ අතර, එම බදුකරු රු. 15,917 ක්වූ මාසික බදු මුදල නියමිත පරිදි ගෙවා නොතිබුණි. ගිවිසුම් අත්සන් කිරීම 2013 ජූලි 15 දින දක්වා මාස 05 ක් ප්‍රමාද වී තිබුණි.

iii. සභාව සතු පොදු වෙළඳසැල් කඩකාමර 01 කින් සහ සතිපොල කඩකාමර 03 කින්, 2013 දෙසැම්බර් 31 දිනට හිඟහිටි කාලය මාස 02 සිට මාස 07 ½ ක් දක්වා අයවිය යුතු මුදලින් රු. 23,500 ක මුදලක් තවදුරටත් අයකර ගැනීමට තිබුණි.

2.3.4 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආවරණ මඩු කුළියට දීමේදී ඉතාමත් අඩු මුදලක් අයකරනු ලබන අතර, එකී ගාස්තු කාලීනව සංශෝධනය නොවීම හේතුවෙන් දින 07 ක් සඳහා රු. 200 ක් වැනි අඩු වටිනාකමක් අයකර ගෙන තිබුණි. එලෙස අයකරනු ලබන සුළු ගාස්තු මුදලද, නිසි පරිදි අය නොවන අතර, විගණිත දිනය වූ 2014 පෙබරවාරි 26 දින වනවිට විවිධ පුද්ගලයන්ගෙන් හා ආයතන වලින් අවස්ථා 110 කදී රු. 31,200 ක මුදලක් සභාවට අයවීමට තිබුණි. ආවරණ මඩු කුළියට ලබා දීමේ ලේඛනය පරීක්ෂාවේදී භාණ්ඩ ගෙනගිය ස්ථාන පැහැදිලිව නොතිබීම, භාණ්ඩ ආපසු භාරදුන් දිනය නොතිබීම, රැගෙන ගිය ආවරණ මඩු ගණන සඳහන්ව නොතිබීම සහ එළිමහනේ අනාරක්ෂිතව ගබඩා කිරීම ආදී අඩුපාඩු නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුල බල ප්‍රදේශයේ බදු අයකල හැකි ප්‍රදර්ශිත සියළු දැන්වීම්, බැනර් හා නාම පුවරු සඳහා බදු අයකර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේ එම ආදායම රු. 2,880 ක් පමණ අඩු අගයක් ගෙන තිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු වටිනාකම රු. 2,664,284 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය මඟින් සලසන මන්ත්‍රී ප්‍රතිපාදන සංවර්ධන කටයුතු සඳහා යොදාගත යුතු අතර, සුභසාධන කටයුතු සඳහා යොදා නොගත යුතු වුවත්, ඊට පටහැනිව අවස්ථා 19 කදී රු. 1,450,050 ක් වටිනා සුභසාධන භාණ්ඩ මිලදී ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2012 ජූනි මස සිට ආදායම් පරිපාලක තනතුරු 02 ක් පුරප්පාඩු වී තිබීම හේතුවන් සභාවේ දැන්වීම් පුවරු, වෙළඳ බලපත්‍ර වැනි ක්ෂේත්‍ර කටයුතු වල නියැලීමෙන් ලබාගත හැකි ආදායම් අහිමි වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු අංක එස්පී ආර්එස් 0780 දරන බැකෝ ලෝඩර් යන්ත්‍රයට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී පැය 1224 ක කාලයක් සේවයේ යොදා තිබියදී ඉන් පැය 50 ක කාලයක් වෙනුවෙන් රු. 60,792 ක ආදායමක් උපයා තිබුණි. මෙම කාලය මුළු සේවා කාලයෙන් සියයට 4 ක තරම් අඩු අගයක් ගෙන තිබූ අතර, සේවයේ යෙදවූ කාලයට සාපේක්ෂව ලැබී තිබූ ආදායම ඉතාම අඩු අගයක් ගෙන තිබුණි. සභාවට අදාල රාජකාරී වලට අමතරව සභාපතිතුමාගේ සහ මන්ත්‍රී වරුන්ගේ උපදෙස් පරිදි නිරතුරුවම යන්ත්‍රය සේවයේ යෙදවීම් කර තිබූ අතර, ඒ සඳහා කාර්මික නිළධාරියෙකුගේ ඇස්තමේන්තුවක් හෝ අධීක්ෂණයක් සිදු නොවූ අතර, ඒ සඳහා මුදල් අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු සඳහා වැටුප් වශයෙන් රු. 196,749 ක්ද, යන්ත්‍ර අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු. 778,831 ක්ද, ඇතුළුව එකතුව රු. 975,580 ක් වැයකර තිබුණි. වර්ෂය තුලදී උපයන ලද රු. 60,792 ක ආදායම සමඟ වියදම් සැසඳීමේදී ආදායම් ඉපයීමේ ප්‍රතිශතය සියයට 06 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක් තිස්සේ ඉදිරියට එන රු. 47,526 ක ණයගැති විදුලි ගබඩා ශේෂය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු
-----------------------

2013 පෙබරවාරි 26 දින සිට මාර්තු 03 දක්වා තායිලන්ත සංචාරය සඳහා සභිකයින් දෙදෙනෙකුට රු. 90,000 බැගින් සභා අරමුදලින් වියදම් දැරීම සඳහා පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබුණද, අදාල වියදම් විනිවිදභාවයකින් තොරව සිදුකර තිබුණි. පළාත් පාලන ආයතන වල හෝ රාජ්‍ය ආයතන වල අරමුදල් වැය කර විදේශ අධ්‍යයන චාරිකා සඳහා සහභාගී විය යුත්තේ එමගින් ආයතන වලට සෘජු ප්‍රතිලාභ ලැබෙන්නේ නම් පමණි. අදාල සංවිධානය හෝ විදේශ රජය හෝ විදේශ සංවිධානය හෝ ඒ සඳහා වැය වන සියළු වියදම් හා පහසුකම් දැරිය යුතු වුවද, විදේශ පුහුණු වැඩ සටහන කුමක් සඳහාද යන්න කිසිඳු සඳහනකින් තොරව 2013 පෙබරවාරි 19 දින රු. 180,000 ක වියදම් දරා තිබුණි. තවද, විදේශ සංචාරය සඳහා සහභාගී වන අය රටින් බැහැර යාම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අවසරය ලබාගත යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබූ අතර, පුහුණුව අවසානයේ ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳ වාර්තාවක්ද ඉදිරිපත් කර නොතිබුණි.

3.4 ආර්ථික නොවූ ගනුදෙනු
----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 250-0584 දරන කැබ් රථය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුල රු. 842,590 ක අළුත්වැඩියා වියදම් දරා තිබූ අතර, එයින් රු. 437,649 ක් ණයහිමි බැඳීම් විය. මෙම කැබ් රථය ධාවනයට සුදුසු තත්ත්වයක නොමැතිව විගණිත දිනය වූ 2014 පෙබරවාරි 26 දින වන විටද සබරගමුව පළාත් සභාවේ සංවර්ධන, නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර තිබුණි.

(ආ) ඉහත අංකය සඳහන් වාහනයට 2013 පෙබරවාරි 18 දින වවුචර් අංක 212 මඟින් රු. 107,998 ක් වටිනාකමැති ටයර් 04 ක් යොදා තිබූ අතර, ඉන් එක් ටයරයක කම්බි මතුවී ධාවනයට සුදුසු නොවන තත්ත්වයට පත්වී නැවත 2013 ඔක්තෝබර් 21 දින වවුචර් අංක 1172 මඟින් රු. 16,500 ක් වැයකර තවත්

අළුත් ටයර් 01 ක් මිලදී ගෙන තිබුණි. ධාවන තත්ත්වයේ නොතිබූ වාහනයක් සඳහා මෙසේ ටයර් වෙනුවෙන් වියදම් දැරීම ප්‍රශ්නකාරී තත්ත්වයක පැවතුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පළාත් සභා ප්‍රතිපාදන යටතේ රු. 98,749 ක ඇස්තමේන්තු මුදලක් මත දොලොස්වල ග්‍රාම සංවර්ධන සමිතිය මඟින් දොලොස්වල පන්සලේ රිද්ම රංග කලායතනයේ ගොඩනැගිල්ල කපරාරුව සිදුකර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

අවසාන කොටස් මුදල් ගෙවීම් වාර්තාවට අනුව ඇස්තමේන්තුවේ විෂයය අංක 2 යටතේ පැති බැම් වල මතුපිට කපරාරුව යථා පරිදි සිමෙන්ති, වැලි මිශ්‍රණය යොදා නොතිබූ බැවින් පරීක්ෂණ අවස්ථාව වූ 2014 පෙබරවාරි 26 දින වනවිට කපරාරුව පහසුවෙන් ගැලවී යාමට ලක්වී තිබුණි.

i. ගොඩනැගිල්ල බිම කපරාරුව ඇස්තමේන්තු විෂයය අංක 1 යටතේ සිමෙන්ති, වැලි කපරාරු කර මතුපිට රතු සහ කළු සිමෙන්ති මැද නිම කර තිබූ අතර, එකී බිම බොහෝ ස්ථාන ඉරිතලා පුපුරා තිබුණි. එවැනි ස්ථාන 05 ක් පමණ නැවත අළුත්වැඩියා කර තිබූ අතර, ගෙබිම ඉරිතලා තිබූ කොටස් පළුඳු කර පරීක්ෂාවේදී එකී බදාම ඉතා පහසුවෙන් ගැලවී ලිහී ගිය බව තහවුරු වුණි. ඒ අනුව ඉටු කරන ලද රු. 51,642 ක වැඩ කොටස් නිශ්ඵල බවට පත්වී තිබුණි.

ii. ඇස්තමේන්තුවේ විෂයය අංක 2 යටතේ බිත්ති කපරාරුව දිග අඩි 12, පළල අඩි 17.5 ක් වන වර්ග අඩි 209 ක කොටස අවසාන කොටස් ගෙවීම් යටතේ වැඩිපුර බිල්පත් සකසා ඒ සඳහා රු. 9,388 ක ඉටු නොකල වැඩ වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

1988 ප්‍රදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

වැය විෂයයන් 18 කට අදාලව රු. 3,950,597 ක ප්‍රතිපාදන කිසිඳු කාර්යයකට නොයොදා මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය